



# little Ruby

B.M.W.J.M PULNARA SETHUMLI



# Little Ruby

**කතෘ: B.M.W.J.M.පුල්නාරා සෙතුම්ලි**

**මහාමායා බාලිකා විද්‍යාලය**

# Little Ruby

**B.M.W.J.M.පුල්නාරා සෙතුම්ලි**

**කතෘ**

**පළමු දිගහැරුම**

**මහාමායා බාලිකා විද්‍යාලය**

**5 ශ්‍රේණිය B**

**ACP ප්‍රින්ටර්ස් අම්පිටිය**

**මුද්‍රිත දිනය 2026.05.21**

**ISBN number 987-624-211-260-2**



# පිදුම

ආදරෙන් මාව

බලාගන්නා

අත්තම්මා ට....

# පෙරවදන



දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරන බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරන හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම් කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොතේ ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධිර විදුහල්පතිනිය
විදුහල්පතිනි මහාමායා බාලිකා විදුහල

Once upon a time there was a small cute kitten. It had soft white fur and big shine eyes everyone who saw the kitten loved it. Because it looked very sweet and friendly.

එකමත් එක කාලෙක පොඩි ලස්සන පූස්  පැටියෙක් හිටියා එයාට මෘදු සුදු ලෝම තිබුණා ලොකු දිලිසෙන ඇස් තිබුණා. එයාව දැක්කම හැමෝටම ආදරය හිතෙනවා. මොකද එයා බොහොම සුවඳයි ප්‍රියමනාපයි .



The kitten lived in a small house, with a little girl Named Nila. Nila love kitten very much and named “Ruby". Every day she gave Ruby fresh milk and played with it in the garden. Ruby likes to run following butterflies, jump happily and play with a red ball.

ඒ පූස් පැටියා පොඩි ගෙයක් ඇතුලේ නීලා කියන පුංචි ගෑණු ළමයෙකුත් එක්ක ජීවත් වුණා. නීලා එයාට ගොඩක් ආදරේ "රූබී" කියලා නමකුත් දාගත්තා. හැමදාම නීලා රූබීට කිරි දීලා ගෙදර ඉදිරියේ තිබෙන ගෙවත්තෙහි සෙල්ලම් කරන්න පුරුදු වුණා. රූබී උඩ පනිමින්, දුවමින්, සමනලයින් අල්ලමින් සෙල්ලම් කරා.



One sunny day Ruby went outside to play. But it did not come back home. Nila become worried and sad. She looked for in the garden, near the road, behind the house, she called "Rubu ...... Ruby....” But it was no answer.

එක් හිරු එළියෙන් පිරුණු දවසක රූබි ගෙදරින් පිටට ගිහිල්ලා සෙල්ලම් කළා. ඒත් එයා ආයේ ගෙදර ආවේ නැහැ නීලා ගොඩක් බයවෙලා දුක්වෙලා හැම තැනම රූබිව හොයන්න ගියා "රූබි .....රූබි" කියලා හඬගා කතා කළා ගෙදරවටේත් වත්තෙත් හෙවුවා, නමුත් පිළිතුරක් ලැබුණේ නැහැ.



After a long time, Nila head a soft meow...sound .she followed the sound and found Ruby under a big tree. The kitten looked the scared but it was safe.

ටික වේලාවකට පස්සේ නීලාට පොඩි ඥාව් හඬක් ඇහුනා ඒ හඬ අනුගමනය කරලා ගියාම ලොකු ගසක් යට රූබී හිටියා එයා ටිකක් බය වෙලා හිටියත් ආරක්ෂිතව හිටියා.



Nila was very happy .she gently picked up Ruby  hugged it tightly, and look it back home .From that day on the took extra care of her little  kitten  and never let it go for along .

නීලා ගොඩක් සතුටු වුණා එයා රූබීව ආදරයෙන් උත්සාගෙන තදින් වැළඳගෙන ගෙදරට ගෙනාවා. එදා ඉදලා නීලා තමන්ගේ පූස්  පැටියාව තවත් හොඳින් බලාගෙන එයාට තනියම දුරට යන්න දුන්නේ නැහැ.



One day ruby’s birthday came. But nila is so sad because, that she couldn’t by a gift for ruby. But Nila 's mother said nila love and kindss is the best gift you can give for ruby.

එක දවසක් රූබීගේ උපන්දිනය ආවා . ඒත් නීලට හරිම දුකයි. මට රූබී ට තෑග්ගක් ගන්න බැරි උනා නීලා කිව්වා. ඒත් නීලගේ අම්මා කිව්වා එයාට රූබීට දෙන්න පුළුවන් හොඳම තෑග්ග තමයි ආදරය සහ කරුණාව කියලා.



So 'the gift given by nila was the biggest gift for ruby. That was the best day ever for ruby and everyone

ඒත් රුබීට ත් එදා නීලාගේ අම්මා දුන්න තෑග්ග ලොකුම තෑග්ග උනා. එදා තමයි රුබීගේ හොදම දවස.ඒක හැමෝටම සතුටුදායක දවසක් උනා.




Time was passed very fastly in day by day. Ruby was grow up by little by little nila, s dad was in dubai. Nila,s dad said that we will come bake soon . Nila was very happy.

ටික දවසක් ගියා, රුබි ටිකක් ලොකු උනා. නීලාගේ තාත්තා ඩුබායි වල හිටියේ. නීලාගේ තාත්තා තෑගි ගොඩක් ගේන්නම් කිව්වා. තාත්තා එන නිසා නීලාට ගොඩක් සතුටුයි.



That day was come. Nila,s dad came home nila,s dad day lot of gifts for them . But ruby was feel like sick sot they take ruby to a doctor.

ඔන්න ඉතින් ඒ දවස ආවා. නීලාගේ තාත්තා ගෙදර ආවා. එයා ගොඩක් තෑගි ගෙනාවා. අද රැබීට ටිකක් උණ වගේ. ඒක හින්දා එයාලා රැබිව වෛද්‍යවරයෙක්ට පෙන්නුවා.



Ruby got lot of medicines that he didn’t like. Nila was feeling very sad for ruby. Nila,s dad will go to dubari tomorrow  "my daughter you have taken good care on ruby and on mother nila,s dad said . Ok dad i will do my best on and my mother. Ruby was recovering soonly.

රුබීට තිත්ත බෙහෙත් ගොඩක් හම්බ  උනා.පව් රුබී.. නීලාට බොහොම  දුකයි . තාත්තා  හෙට  රට යනවා . තාත්තා නීලට මෙහෙම කිව්වා "දුවේ ඔයා  රුබීව හොදට  බලා ගන්න ඕන" නීලා  හා තාත්තේ  කිව්වා. රුබීට  ඉක්මනට සුව වුණා .



So, ruby got a friend also. It is brown in colour  and eyes are in green colour. It also like ruby. But he is always in after. It’s name is oliver.

ඔන්න ඉතින් රූබීට  යාලුවකුත් හම්බ වුණා. එයා  දුඹුරු පාටයි. එයාට කොල පාට ඇස් තියෙනවා. එයත් රූබි  වගේමයි. හැබැයි ටිකක් විතර බයයි . එයාගේ  නම ඔලිවර් .




But same times came to our home. And ruby also went to olivers too. They are our neighbours. The lieve in the upper part of the road.


එයා වෙලාවකට අපේ ගෙදරත් එනවා. රූබිත් එයාලගේ ගෙදර යනවා. අපේ ගෙදරට උඩහ ගෙදර තමා එයාලා ඉන්නේ.



But Ruby’s friend come in to our kitchen and ate all the food we kept for Ruby .It’s a very naughty kitten.

හැබැයි රුබී ගේ  යාළුවා අපේ ගෙදර ඇවිල්ලා රුබී ගේ කෑම ඔක්කොම  කනවා හැබැයි කුස්සියේ බඩුත් පෙරලනවා. හරිම නරක පූසෙක්.




The end
Ruby
Ruby

# පසුවදන



අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළ යුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් “හේමමාලා උපහාර” ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාළිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සත්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම් (ව්‍යාපෘති නිර්මාතෘ)